PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

සභාපතිතුමා ඇතුලු සියලුම කොමසාරිස්වරුන්,
මැතිවරණ කොමිෂන් සභාව,
නො.02, සරණ මාවත,
රාජගිරිය
2024-07-10

**පළාත් පාලන ආයතන සඳහා ආණ්ඩුකාරවරුන්ගේ නියෝජිතයින් පත්කිරීම**

දකුණු පළාත් ආණ්ඩුකාරවරයා අනුව යමින් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාද පළාත් පාලන අපේක්ෂකයන් ආණ්ඩුකාරවරයාගේ සම්බන්ධීකාරවරුන් ලෙස ඒ ඒ පළාත් පාලන බල ප්‍රදේශ සඳහා පත්කර ඇති බව වාර්තාවේ.

ඊට අදාල ලිපියත් මේ සමග අමුණා ඇත. මෙය පැහැදිලි ලෙසම මැතිවරණ කොමිෂන් සභාවේ චක්‍රලේඛ නොසලකා හැරීමකි. එකී ලිපියෙහි මැතිවරණ නීතියට අනුකූලව කටයුතු කරන ලෙස දැන්නුවද අදාල පත්වීමේ රාජකාරි ලෙස බැලූ විට පැහැදිලිව පෙනීයන්නේ පළාත් පාලන ආයතන නියෝජිතයින් ලෙස සිදුකල සියලු රාජකාරී ඊට ඇතුළත් කර ඇති බවයි.

එමෙන්ම දැනගන්නට ලැබී ඇති පරිදි එසේ පත්වීම් ලද පත්වීම්ලාභීන් පළාත් පාලන ආයතන නිලධාරීන් අමතා කාර්යාල පහසුකම් ඉල්ලා ඇත. මෙය එම නිලධාරීන්ටද නීති විරෝධී අයුරින් කටයුතු කිරීම සඳහා බලකිරීමක් ලෙස පෙනීයයි.

තවද හෙට (11) දිනයේ පෙරවරු 10.00ට පළාත් පාලන ආයතනවල ලේකම්වරුන් හා කොමසාරිස්වරුන් ආණ්ඩුකාර කාර්යාලය වෙත කැඳවා ඇති බවද වාර්තාවන අතර මේ පිළිබඳව සොයාබලා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

පිටපත්

මාර්ෂල් ඔෆ් ද එයාර්ෆෝස් රොෂාන් ගුණතිලක මහතා, ආණ්ඩුකාරතුමා, බස්නාහිර පළාත.

මාධ්‍ය ආයතන හා උනන්දුවක් දක්වන සෙසු පාර්ශව

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com